# 7 සඵල වූ මෙසියානික අනාවැකි

## සෙකරියස් තුමාට ස්නාවක ජොහන් තුමාගේ උපත දැනුම් දීම

සෙකරියස් තුමා ජුද ආගමේ පූජකයෙකි. එක්තරා දවසක් ස්වාමීන් වහන්සේගේ ශුද්ධාසනයට පිවිස සුවඳ දුම් පූජා කිරීමේ වාරය, දාදු දැමීමෙන්, සෙකරියස් තුමාට පැවරිණි. ස්වාමීන් වහන්සේගේ දූතයෙක් එතුමාට දර්ශනය විය. සෙකරියස් තුමා ඔහු දැක කැළඹී බියපත් විය. දේව දූතයා එතුමාට කතා කොට මෙසේ පැවසී යː

> සෙකරියස්, බිය නොවන්න. මන්ද, ඔබේ යාච්ඤාව අසනු ලැබී ය. ඔබේ බිරිඳ වන එලිසබෙත් ඔබගෙන් පුතෙකු ලබන්නී ය. ඔහුට ජොහන් යයි නම් තබන්න.
>
> (ලූක් 1:13)

එම දේව පණිවුඩය අදහා ගත නොහැකි වූ මහලු සෙකරියස් තුමා දේව දූතයාගෙන් මෙසේ විමසා සිටියේ යː

> මා මෙය දැනගන්නේ කෙසේ ද? මම මහල්ලෙක්මි; මාගේ භාර්යාව ද වයස්ගත ව සිටී.
>
> (ලූක් 1:18)

දේව පණිවුඩය අවිශ්වාස කළ සෙකරියස් තුමාට විපාක හිමි විය.

> බලන්න, නියම කාලයෙහි ඉටුවන්න යන, මා කී දේ ඔබ අවිශ්වාස කළ බැවින්, මේ කාරණා සිදු වන දවස දක්වා ඔබ කතා කළ නොහැකි ව නිහඬ වනු ඇත.
>
> (ලූක් 1:20)

සෙකරියස් තුමා හා එලිසබෙත් තුමිය මහලු ව සිටිය දී දේව දූතයා ප්‍රකාශ කළ පරිදි ම දරුවෙකු ලැබිණි. එමගින් දේව දූතයා ප්‍රකාශ කළ අනාවැකිය ඉටු විය.

## මරිය තුමියට ජේසුස් වහන්සේගේ උපත දැනුම් දීම

ගාබ්‍රියෙල් දේව දූතයා ගලීලයේ නාසරෙත් නුවර විසූ දාවිත් රජ පරපුරෙන් පැවත එන ජුසේ තුමාට විවාහ ගිවිසුම් දී සිටි කන්‍යා මරිය තුමිය වෙත පැමිණ මෙසේ පැවසී ය.

> විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ; සමිඳාණන් වහන්සේ ඔබ සමග ය.
>
> (ලූක් 1:28)

එම දේව පණිවුඩය අසා මරිය තුමිය අතිශයින් කැළඹී මේ කෙබඳු ආචාරයක් දැයි සිත සිතා සිටින විට දේව දූතයා නැවත එතුමිය ඇමතුවේ ය.

> මරියාණනී, බිය නොවන්න, ඔබ දෙවියන් වහන්සේගෙන් වරප්‍රසාද ලද්දෙහි ය. මේ බලන්න, ඔබ පිළිසිඳගෙන පුතෙකු ලබන්නෙහි ය; උන්වහන්සේට ජේසුස් යන නාමය තබන්න. උන්වහන්සේ ශ්‍රේෂ්ඨ වන සේක, පරමෝත්තමයාණන්ගේ පුත්‍රයාණෝ යයි කියනු ලබන සේක; උන්වහන්සේගේ පිය වූ දාවිත්ගේ සිංහාසනය දෙවි ස්වාමීන් වහන්සේ උන්වහන්සේට ප්‍රදානය කරන සේක; උන්වහන්සේ ජාකොබ්ගේ වංශය කෙරෙහි සදහට ම රජකම් කරන සේක; උන්වහන්සේගේ රාජ්‍යය කෙළවරක් නොදක්නේ ය"
>
> (ලූක් 1:30-33)

මරිය තුමිය ගාබ්‍රියෙල් දේව දූතයාගේ පණිවුඩය දැඩි ලෙස විශ්වාස කර දේව හඬට කීකරු වූවා ය.

## ජුසේ තුමාට ජේසුස් වහන්සේගේ උපත දැනුම් දීම

මරිය තුමිය හා ජුසේ තුමා විවාහ ගිවිසගෙන සිටිය දී එතුමිය ගැබ්ගෙන සිටින බව ජුසේ තුමා දැන ගත්තේ ය. සත් පුරුෂයෙකු වූ ජුසේ තුමා, එතුමිය ප්‍රසිද්ධියේ නින්දාවට නොපමුණුවන අදහසින්, රහසින් එතුමිය අත්හැර දමන්නට සිතා ගත්තේ ය. එහෙත් එතුමා මේ කාරණය ගැන කල්පනා කරමින් සිටිය දී සමිඳාණන් වහන්සේගේ දූතයෙක් සිහිනයකින් එතුමාට දර්ශනය වී මෙසේ ප්‍රකාශ කළේ ය.

> දාවිත්ගේ පුත් ජෝසෙප්, ඔබේ බිරිඳ වන මරියා පාවා ගන්නට බිය නොවන්න; මන්ද, ඇ ගැබ්ගෙන ඇත්තේ ශුද්ධාත්මයාණන් අනුහසිනි. ඈ පුතෙකු බිහි කරන්නී ය; උන්වහන්සේට ජේසුස් යන නාමය තැබිය යුතු ය; මන්ද සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝ ය.
>
> (මතෙව් 1:20-21)

ජුසේ තුමා නින්දෙන් අවදි වූ විට සමිඳාණන් වහන්සේගේ දූතයා එතුමාට අණ කළ ලෙස සිය බිරිඳ කැන්දගෙන ගියේ ය.

## ජේසුස් වහන්සේගේ උපත

කලකට පෙර ඒ බෙත්ලෙහෙමේ - ශුද්ධ වූ නගරේ
ජේසු මෙලොවට බිහි වුණේ - පුංචි ගවමඩුවේ //

උදුවප් මාසේ සීතල දවසක මැදියම් රෑ යාමේ
දෙව්මවු තුරුලේ උණුසුම ලබමින් මේ ලෝකෙට ආවේ

සීත සුළං රැළි දසත හමද්දී සැතපීලයි උන්නේ
දුප්පත් එඬේරු මේ බව දැන ගෙන ගවලෙන වෙත යන්නේ

මරිය තුමීගේ පෙම්බර මුහුණේ එළියක් දිස්වූයේ
ජුසේ තුමා කිසිදාකත් නෑ දෙව් අණකට පිටුපෑවේ

වටපිට රොක් වී උම්බෑ ගාමින් හරකුන් කෑ ගසතී
රජතුන් කට්ටුව බිළිඳු ළඟ වැටී පඬුරු ඔප්පු කරතී

මිනිස් සමාජය පාපෙන් බේරා ගන්නට මෙහි ආවා
දිවැස්වරුන් බොහෝ කලකට පෙර කී දේ ඉන් ඉටුවූවා

ඉහත ගීතිකාව තාලයට ගායනා කරන්න.

නොමිලේ බෙදාහැරීම සඳහා ය.

ජේසුස් වහන්සේගේ උත්පත්තිය ශුද්ධ වූ ලූක් තුමා වාර්තා කරන්නේ මෙසේ ය:

> එසමයෙහි, අධිරාජ්‍යයේ සියලු වැසියන්ගේ සංගණනයක් ගැනීමට අගොස්තුස් අධිරාජයා වෙතින් නියෝගයක් නික්මිණි. මේ වනාහි කුරේනියස් සිරියාවේ ආණ්ඩුකාරයා ව සිටිය දී කරන ලද පළමුවන සංගණනය යි. සියල්ලෝ ලියාපදිංචි වනු පිණිස තම තමන්ගේ නුවරවලට ගියහ. ජෝසෙප් ද දාවිත්ගේ වංශය හා පෙළපතට අයිති වූයෙන්, ගලීලයේ නාසරෙත් නුවරින් නික්ම ජුදයේ බෙත්ලෙහෙම් නම් දාවිත්ගේ නුවර බලා ගියේ ය. ඔහු ගියේ, තමාට විවාහ ගිවිසුම් දුන්, ගැබ්ගෙන සිටි මරිය තුමී සමග ලියාපදිංචි වන පිණිස ය. තව ද, ඔවුන් එහි සිටිය දී ඇගේ ප්‍රසව කාලය සම්පූර්ණ විය. ඈ කුලුඳුල් පුත්‍රයා බිහි කොට රෙදිවලින් ඔතා, නවාතැන්ගෙයි ඉඩකඩ නොතිබුණු බැවින්, ගව ඔරුවක බැවූවා ය.
>
> (ලූක් 2:1-7)

ජේසුස් වහන්සේගේ උත්පත්තියත් සමග උන්වහන්සේ පිළිබඳ ව දිවැසිවරු පවසා තිබූ දිවැස් වැකි සඵල විය. මරිය තුමිය දේව හඬට කීකරු වී තමන් මුළුමනින් දෙවියන් වහන්සේට කැප කළා ය. ජුසේ තුමා ද දේව හඬට සවන් දුන්නේ ය. දෙවියන් වහන්සේගේ හඬට අප ද කීකරු විය යුතු ය. දෙවියන් වහන්සේ විවිධ මාර්ගවලින් අපට කතා කරන සේක. අපි ඒ හඬට ඇහුම්කන් දිය යුතු වෙමු. ජේසුස් වහන්සේ දිළින්දෙකු ලෙස බෙත්ලෙහෙමේ උපත ලැබූ අතර උන්වහන්සේ දිළින්දන්ගේ සිත් සනසන සේක.

**ක්‍රියාකාරකම**

1. පහත සඳහන් බයිබල් පාඨයන්හි අවස්ථා සම්බන්ධය වෙන වෙන ම ලියන්න. (කවරෙකු විසින් කාහට කියන ලද්දක් ද?)
   - i. "මා මෙය දැනගන්නේ කෙසේද? මම මහල්ලෙක්මි;"
   - ii. "විපුල ප්‍රසාද ලත් උත්තමිය, ඔබට මංගල වේ; සමිඳාණන් වහන්සේ ඔබ සමග ය"
   - iii. ".... මන්ද සිය සෙනඟ ඔවුන්ගේ පාපවලින් මුදාලන්නේ එතුමාණෝ ය"

**ජීවිතයට බිඳක්**

***දේව වචනය මෙනෙහි කිරීමටත් එමගින් අනාවරණය වන දේව හඬට අවනත ව ජීවත් වීමටත් කටයුතු කරමු.***